

# දකුණු පළාත් සභාව

தென் மாகாண சபை

**SOUTHERN PROVINCIAL COUNCIL**

## අධ්‍යාපන , ඉඩම් හා ඉඩම් සංවර්ධන , මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

கல்வி, காணி மற்றும் காணி அபிவிருத்தி, லைகவ் மற்றும் தகவல்நெடுஞ்சா நுறை அமைச்சு

**Ministry of Education, Land & Land Development, Highways & Information**

**බිම් මහල, “දක්ෂිණ පාය” , ලබුදූව, ගාල්ල.** கீழ் மாடி,"தக்ஷின பாய",லபுதுவ,காலி. Ground Floor, “Dakshina Paya” , Labuduwa, Galle.

| | | |
|---|---|---|
| මගේ අංකය. / எனது இல. / My No. SP/EDUMIN/AD/03/02/LD/An/Tr(2026) | ඔබේ අංකය. / உமது இல. / Your No. | දිනය. / திகதி. / Date. 2026.07. 20 |

දකුණු පළාත් ඉඩම් කොමසාරිස්,
දකුණු පළාත් සහකාර ඉඩම් කොමසාරිස්,
සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය -ගාල්ල, මාතර,හම්බන්තොට.

<u>වාර්ෂික ස්ථාන මාරු - 2026</u>

<u>*ජනපද නිලධාරී සහ මැනුම් ක්ෂේත්‍ර සහායක - දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය*</u>

උක්ත කරුණ සම්බන්ධ මගේ අංක 02/2026 දරණ ජනපද නිලධාරීන්ගේ සහ මැනුම් ක්ෂේත්‍ර නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු අභ්‍යන්තර චක්‍රලේඛය හා බැදේ.

02. ඒ අනුව, උක්ත සේවාවන්හි සේවයේ නියුතු නිලධාරීන් සම්බන්ධයෙන් 2026 වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන මණ්ඩලයේ (අභියාචනා) නිර්දේශ ප්‍රකාරව සකස් කරන ලද ස්ථාන මාරු සමාලෝචන මණ්ඩල තීරණ අමාත්‍යාංශයීය නිල වෙබ් අඩවියට (edumin.sp.gov.lk) යොමු කර ඇති අතර, එම ස්ථාන මාරුවීම් ලබා දී ඇති නියමිත දින සිට ක්‍රියාත්මක කරන ලෙස මෙයින් දැනුම් දෙමි.(ඇමුණුම -01)

03. ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක දින වන විට ප්‍රසූත නිවාඩු ලබා ඇති නිලධාරිනියන්ගේ ස්ථාන මාරුවීම් ප්‍රසූත නිවාඩු අවසන්ව සේවයට වාර්තා කළ දිනට සතියකට පසු ක්‍රියාත්මක කළ යුතුය.

04. තවද , මෙම ස්ථාන මාරුවීම් නියෝග පිළිබඳව අදාළ නිලධාරීන්ට කල් ඇති ව දැනුම් දී නියමිත දිනයේදී නව සේවා ස්ථානයෙහි රාජකාරී බාර ගැනිමට හැකි වන පරිදි ඔවුන් සේවයෙන් නිදහස් කිරීමට කටයුතු කළ යුතු අතර,නියමිත දිනයේදී නව සේවා ස්ථානයට වාර්තා නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බවට ද අදාළ සේවක නිලධාරීන් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

05. සමාලෝචන මණ්ඩල තීරණ ( අභියාචනා) සම්බන්ධයෙන් අතෘප්තියට පත් නිලධාරීන්ට 2026.06.01 දිනැති 02/2026 අංක දරණ අභ්‍යන්තර චක්‍රලේඛයෙහි අංක 10 ප්‍රකාරව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කළ හැකිය. අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ මාරු සමාලෝචන මණ්ඩලයට අභියාචනා ඉදිරිපත් නොකළ, නිලධාරීන් මේ සඳහා අයදුම් නොකල යුතුය. තවද ආකෘතියට පටහැනි අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඇමුණුම -02)

06. මේ සමඟ යොමු කරනු ලබන අභියාචනා අයදුම්පත්‍රය සිය ආයතන ප්‍රධානියා මඟින් සෘජුවම මෙම දැනුම් දීමෙන් පසු දින 14 කට පෙර දකුණු පළාත් ඉඩම් කොමසාරිස් වෙත යොමු කළ යුතු අතර සෘජුවම දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත සිය අභියාචනා අයදුම්පත්‍රය ඉදිරිපත් කල නොහැකි බව ද අවධාරණය කරමි.

එන්.කේ.ආර්. පතිරණ
ලේකම්
අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන,
මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය
දකුණු පළාත.


**ලේකම්** / செயலாளர் / Secretary: 091-2246156, 091-2030701
**කාර්යාලය** / காரியாலயம் / Office: 091-2030700 **පාලන** / நிர்வாகம் / Administration; 091-2030705 **අධ්‍යාපන** / கல்வி / Education; 091-2030703 **සැලසුම්** / திட்டமிடல் / Planning; 091-2030702 **ගිණුම්** / கணக்காய்வ / Accounts
**ෆැක්ස්** / பெக்ஸ் / Fax: 091-2246157, 091-2234044
**ඊමේල්** / மின்னஞ்சல் / E-mail : secretary@edu.min.spgov.lk **ක්ෂණික ඇමතුම්** / அதிரடி அழைப்பு / Hot Line : 091-2030700 **වෙබ් අඩවිය** / இணையத்தளம் / web site : www.edumin.sp.gov.lk

07. ඒ අනුව ,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතට අයදුම්පත් යොමු කරන නිලධාරීන්ගේ ස්ථාන මාරු හා එම ස්ථාන මාරු ගැලපුමෙහි නම සඳහන් අනෙකුත් නිලධාරීන්ගේ ස්ථාන මාරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දැනුම් දෙන තුරු තාවකාලිකව අත්හිටුවනු ලබන අතර,එලෙස පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතට අභියාචනා ඉදිරිපත් කර ඇති නිලධාරීන්ගේ නාම ලේඛනය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ නිල වෙබ් අඩවියේ(edumin.sp.gov.lk) පළ කිරීමට කටයුතු කරනු ලැබේ.

08. එබැවින් , ඔබ අදාල නිලධාරීන් වෙත අභියාචනා මණ්ඩලයේ තීරණ නොපමාව දැනුම් දීමට කටයුතු කරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

එන්.කේ.ආර්. පතිරණ,
ලේකම්

එන්.කේ.ආර්. පතිරණ
ලේකම්
අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන,
මහා මාර්ග හා ප්‍රවාහන අමාත්‍යාංශය
දකුණු පළාත.